# ව්‍යාපාරයක මූල්‍ය කටයුතු

ව්‍යාපාරයකට අරමුදල් අවශ්‍ය වනුයේ,

I. ව්‍යාපාරය ඇරඹීමට
II. ව්‍යාපාරයේ දෛනික කටයුතු පවත්වාගෙන යාමට
III. ව්‍යාපාරය පුළුල් කිරීමට

**ප්‍රාග්ධන අවශ්‍යතා**

ව්‍යාපාරයක කෙටිකාලීන සහ දිගුකාලීන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අරමුදල් අවශ්‍ය වේ.

- කෙටි කාලයේදී ව්‍යාපාරයකට ප්‍රධාන වශයෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා අරමුදල් අවශ්‍ය වේ.
- දිගුකාලීන වියදම් යනු ප්‍රධාන වශයෙන් වත්කම් මිලදිගැනීමයි. එනම් ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර යනාදී ස්ථාවර වත්කම්ය.

ව්‍යාපාරයක් ඇරඹීමට අරමුදල් අවශ්‍ය වේ. මෙය ආරම්භක ප්‍රාග්ධනය නම් වේ.

ව්‍යාපාරයක දෛනික කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය අරමුදල් කාරක ප්‍රාග්ධනය නම් වේ. උදා:- අමුද්‍රව්‍ය මිලදීගැනීම, සේවක වේතන ගෙවීම, විදුලිබිල්, ජලබිල් යනාදිය

ව්‍යාපාරයක් පුළුල් කිරීමට ද අරමුදල් අවශ්‍ය වේ.

ව්‍යාපාරයකට අරමුදල් රැස්කරගත හැකි ප්‍රධාන මූලාශ්‍ර ලෙස අයිතිකරුගේ ප්‍රාග්ධනය, බැංකුණය, උකස්ණය, කෙටිකාලීන අරමුදල් දැක්විය හැකිය.

**මූල්‍යය**

ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී මූල්‍ය සම්පත් හිඟ වූ ව්‍යාපාරයකට එහි මූලික අවධියෙන් ඔබ්බට යාමට ඉතා අපහසු වේ.

අභ්‍යන්තර මූල්‍යය යනු ව්‍යාපාරයකට අයිතිකරුවන් යොදවන ප්‍රාග්ධනයයි. තනි පුද්ගල ව්‍යාපාරයක අයිතිකරු විසින්ද සමාගමක නම් කොටස් නිකුතුවෙන්ද ප්‍රාග්ධනය සපයාගත හැක. එසේම වත්කම් විකිණීමෙන්ද අරමුදල් රැස්කරගත හැකිය.

බාහිර මූල්‍යය යනු ව්‍යාපාරයකට බාහිරින් මුදල් සම්පාදනය කරගතහැකි මාර්ග වේ. ඒවා ලෙස වෙළඳ ණය, බැංකු අයිරා හා කල්බදු ආදිය දැක්විය හැක.

ව්‍යාපාරයක මූල්‍යය අභ්‍යන්තර හා බාහිර ලෙස මනා තුලනයකින් පවත්වාගත යුතුය. මන්දයත් ව්‍යාපාරයකට අභ්‍යන්තරව මුදල් සම්පාදනය කරගත්විට ලාභ ලැබීමේදී අයිතිකරුවන්ට ප්‍රතිලාභ ගෙවිය හැකිවන අතර ලාභ නොලබන විටදී ප්‍රතිලාභ ද නොගෙවා සිටිය හැක. නමුත් බාහිර අරමුදල් සඳහා ප්‍රතිලාභ ගෙවීමට ව්‍යාපාරයක් බැඳී සිටිනු ලබයි.

අරමුදල් මූලාශ්‍ර තෝරාගැනීමේ පහත සාධක සලකා බැලිය යුතුවේ.

- අවශ්‍ය මුදල් ප්‍රමාණය
- ණය ගැනීමේ පිරිවැය
- ණය ගැනීමේ අවදානම
- දිගුකාලීන හෝ කෙටිකාලීන බව
- ව්‍යාපාරයේ ප්‍රමාණය

මෙහිදී ව්‍යාපාරය විසින් එහි මූල්‍යය අවශ්‍යතාවය සුදුසු මූලාශ්‍රයක් සමඟ ගලපාගැනීම සඳහා පහත කරුණු කෙරෙහි අවධානය දැක්විය යුතුය.

- අභ්‍යන්තර හෝ බාහිර මූල්‍යයද යන බව
- අරමුදල් සපයාගනු ලබන්නේ කෙටිකාලීනවද දිගුකාලීනවද යන බව
- ආපසු ගෙවීමේ හැකියාව
- ව්‍යාපාරයේ පාලනය යම්දුරකට හෝ බිඳවැටීමකදී වුවද ලබාගත් මූල්‍යය ආපසු ගෙවීමට හැකියාවක් තිබේද යන බව.